මගේ අංකය:ජේඑස්සී/පි.පා/කාර්ය.ම/2025

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**අධිකරණ කාර්ය මණ්ඩල තොරතුරු ලබා ගැනීම - 2025**

2025 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව 2025.08.15 දිනට උපලේඛනගත රජයේ නිලධාරීන් හා අධිකරණවල සේවයේ නියුතු වැඩසටහන් සහකාර (අධිකරණ), ගිණුම් සහකාර, සංවර්ධන නිලධාරීන් පිළිබඳ තොරතුරු රැස්කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව ඔබ අධිකරණයේ දැනට සේවයේ නියුතු උපලේඛනගත රජයේ නිලධාරීන් හා අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර ඇතුළුව) පිළිබඳ විස්තර **ආකෘති පත්‍ර අංක: 01** යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තහවුරුව සහිතව එවිය යුතුය.

03. තව ද අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ගූගල් පෝරම දිගුව වෙත පිවිස ස්වකීය තොරතුරු **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** යාවත්කාලීන කර **2025.08.22 දින හෝ ඊට පෙර** යොමු කරන ලෙස ඔබ අධිකරණයේ සේවයේ නියුතු සියලු උපලේඛනගත රජයේ නිලධාරීන් හා අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර ඇතුළුව) වෙත දැනුම් දෙන්න.

04. ඒ එක් එක් නිලධාරීන් විසින් යොමු කරන ලද දත්තවල නිරවද්‍යතාව පිළිබඳ වගකීම අදාළ නිලධාරියා සතු වන අතර සාවද්‍ය තොරතුරු ඇතුළත් කිරීම විනයානුකූල පියවර ගැනීමට හේතු වන බව මෙයින් අවධාරණය කෙරේ.

05. දැනට ඔබ අධිකරණයේ සේවයේ නොමැති 2025.01.01 දින සිට මේ දක්වා සේවය අත්හැර ගොස් ඇති සහ ඔබ අධිකරණය, ස්වකීය නිත්‍ය සේවා ස්ථානය ලෙස සැළකෙන වැඩ තහනම්ව ඇති/ අනිවාර්යය නිවාඩු පිට සිටින/ දේශීය සහ විදේශ නිවාඩු ලබා සිටින නිලධාරීන් පිළිබඳ විස්තර **ආකෘති පත්‍ර අංක: 02** යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තහවුරුව සහිතව එවිය යුතුය.

06. ඉහත ගූගල් පෝරම දිගුව භාවිතා කරමින් දත්ත එවීමට කටයුතු කර ඇති විවිධ සේවා ගණවලට අයත් (අධිකරණ රෙජිස්ට්‍රාර්, අධිකරණ පවුල් උපදේශක ආදි වශයෙන්) සියලු උපලේඛනගත රජයේ නිලධාරීන්ගේ හා අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර ඇතුළුව) නාම ලේඛනය **ආකෘති පත්‍ර 03** යටතේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තහවුරුව සහිතව එවිය යුතුය.

07. එසේ නිවැරදිව සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර අංක: 01, 02 සහ 03හි දෘඪ පිටපත් **2025.08.25 දින හෝ ඊට පෙර** අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත එවිය යුතු අතර එම ආකෘති පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"කාර්ය මණ්ඩල තොරතුරු – 2025, පිරිස් පාලන අංශය"** යනුවෙන් සඳහන් කල යුතුය.

08. ඉහත ආකෘති පත්‍රවල ඇතුළත් කරනු ලබන සියලු තොරතුරුවල නිරවද්‍යතාව පිළිබඳව අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර් වගකිව යුතු බව අවධාරණය කරනු ලැබේ.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

ප්‍රසන්න අල්විස්
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2025 අගෝස්තු මස 15 වෙනි දින,
කොළඹ - 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.

ආකෘති පත්‍රය - 01

## අධිකරණ කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිබඳ තොරතුරු - 2025

| අනු අංකය | (1) | | (2) | (3) | (4) | (5) | (6) | (7) |
|---|---|---|---|---|---|---|---|---|
| | තනතුර,ශ්‍රේණිය සහ මාධ්‍ය | | *ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව (වෙනත් අධිකරණ වලින් අනුයුක්ත කර සිටින නිලධාරීන් හැර) | **තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව** (වැඩ තහනමට ලක්ව සිටින, වැටුප් රහිත විදේශ නිවාඩු ලැබ සිටින, අනිවාර්යය නිවාඩු යවන ලද නිලධාරීන් හැර) | ඔබ අධිකරණය ට වෙනත් අධිකරණ වලින් අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව | ඔබ අධිකරණයෙන් වෙනත් අධිකරණ වෙත අනුයුක්ත කර ඇති නිලධාරීන් සංඛ්‍යාව | **2025.12.31 දින හෝ ඊට ප්‍රථම විශ්‍රාම යාමට නියමිත නිලධාරීන් සංඛ්‍යාව | සේවයෙන් ඉල්ලා අස් වූ/ සේවයෙන් මුදා හැරි හා සේවය අතහැර ගියා සේ සලකන ලද නිලධාරීන් සංඛ්‍යාව (2025 වසරට අදාළව) |
| 1. | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් | | | | | | | |
| 2. | ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් | | | | | | | |
| 3. | අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් | | | | | | | |
| 4. | අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් | | | | | | | |
| 5. | රෙජිස්ට්‍රාර් | I ශ්‍රේණිය | | | | | | |
| | | II - I ශ්‍රේණිය | | | | | | |
| | | II - II ශ්‍රේණිය | | | | | | |
| | | III ශ්‍රේණිය | | | | | | |
| 6. | පවුල් උපදේශක | I ශ්‍රේණිය | | | | | | |
| | | II ශ්‍රේණිය | | | | | | |
| 7. | වැඩසටහන් සහකාර (අධිකරණ) | | | | | | | |
| | ගිණුම් සහකාර | | | | | | | |
| | සංවර්ධන නිලධාරී | | | | | | | |
| 8. | භාෂණ පරිවර්තක | අධි ශ්‍රේණිය (සිංහල/දෙමළ) | | | | | | |
| | | (සිංහල/ඉංග්‍රීසි) | | | | | | |
| | | (දෙමළ/ඉංග්‍රීසි) | | | | | | |
| | | I/II/III ශ්‍රේණිය (සිංහල/දෙමළ) | | | | | | |
| | | (සිංහල/ඉංග්‍රීසි) | | | | | | |
| | | (දෙමළ/ඉංග්‍රීසි) | | | | | | |
| 9. | ලිපිකරු | අධි ශ්‍රේණිය | | | | | | |
| | | I/II/III ශ්‍රේණිය | | | | | | |
| 10. | ලඝු ලේඛක | අධි ශ්‍රේණිය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | | | | | | |
| | | I/II/III ශ්‍රේණිය (සිංහල) | | | | | | |
| | | (දෙමළ) | | | | | | |
| | | (ඉංග්‍රීසි) | | | | | | |
| 11. | යතුරු ලේඛක | අධි ශ්‍රේණිය (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | | | | | | |
| | | I/II/III ශ්‍රේණිය (සිංහල) | | | | | | |
| | | (දෙමළ) | | | | | | |
| | | (ඉංග්‍රීසි) | | | | | | |
| 12. | පොත් බැඳුම්කරු | | | | | | | |
| | **එකතුව** | | | | | | | |

***(2) ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව -** වැඩ තහනමට ලක්ව සිටින, විදේශ නිවාඩු ලැබ සිටින, අනිවාර්යය නිවාඩු යවන ලද ,ස්ථාන මාරු අත්හිටුවනු ලැබ සිටින, ඔබ අධිකරණයෙන් වෙනත් අධිකරණ වෙත තාවකාලිකව අනුයුක්ත කර ඇති නිලධාරීන් මෙයට ඇතුළත් කළ යුතුය.

***(6)** 2025.12.31 දින වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම යාමට නියමිත නිලධාරීන් හා දැනට විශ්‍රාම යාමට ඉල්ලුම් කර ඇති නිලධාරීන් පමණක් **එම** තීරුවට ඇතුළත් කළ යුතුය.

ඉහත කරුණු පරීක්ෂා කර බලා නිවැරදිව සකස් කරන ලදී.        ආයතන ලිපිකරු : ....................................
රෙජිස්ට්‍රාර්          : ....................................

නිවැරදි බවට සහතික කරමි.

.....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආකෘති පත්‍රය - 02

**<u>දැනට වැටුප් රහිත දේශීය සහ විදේශ නිවාඩු ලබා ඇති/ සේවය අතහැර ගිය/ සේවය අත්හිටවන ලද (වැඩ තහනම්)/ අනිවාර්යය නිවාඩු යවන ලද නිලධාරීන් පිළිබඳ විස්තර</u>**

අධිකරණයේ නම: .................................................................................

| අනුක්‍රමික අංකය | නිලධරයාගේ නම | තනතුර හා ශ්‍රේණිය | දේශීය හෝ විදේශ නිවාඩු ලබා ඇත/ සේවය අත්හැර ගොස් ඇත/ වැඩ තහනම් කර ඇත/ අනිවාර්යය නිවාඩු යවා ඇත යන වග | දේශීය හෝ විදේශ නිවාඩු ලබා ඇති කාලසීමාව හෝ සේවය අත්හැර ගියා සේ සැලකෙන/ වැඩ තහනම් කරන ලද හෝ අනිවාර්යය නිවාඩු යවන ලද දිනය/ |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02. | | | | |

ඉහත කරුණු පරීක්ෂා කර බලා නිවැරදිව සකස් කරන ලදී.

ආයතන ලිපිකරු : .....................................

නිවැරදි බවට සහතික කරමි.

රෙජිස්ට්‍රාර් : ....................................

.....................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

ආකෘති පත්‍රය - 03

**<u>තම පෞද්ගලික දත්ත ගූගල් පෝරමය හරහා යොමු කර ඇති</u>**
**<u>නිලධාරීන් පිළිබඳ විස්තර</u>**

අධිකරණයේ නම: ................................................................................

සේවා ගණය : අධිකරණ රෙජිස්ට්‍රාර්/ අධිකරණ පවුල් උපදේශක..........................ආදී

| අනුක්‍රමික අංකය | නිලධරයාගේ නම | තනතුර හා ශ්‍රේණිය |
|---|---|---|
| 01. | | |
| 02. | | |

ඉහත කරුණු පරීක්ෂා කර බලා නිවැරදිව සකස් කරන ලදී.
ආයතන ලිපිකරු : .....................................

නිවැරදි බවට සහතික කරමි.
රෙජිස්ට්‍රාර් : ....................................

.....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන